# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,873 - 2014 ජූලි මස 25 වැනි සිකුරාදා - 2014.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 580 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 580 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 584 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 590 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත 2014 ජුනි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

579 – B 080859—300 (2014/07)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 353

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

*2012 ජනවාරි මස 01 වැනි දින කර්නල් වශයෙන් :*

නි/3018 බ්‍රවේ කර්නල් වයි. ඒ. එස්. කේ. ජයසිංහ
නි/3023 බ්‍රවේ කර්නල් කේ. පී. පී. චන්ද්‍රලතා (ගැ)

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජුනි මස දින,
කොළඹ දී ය.

07-694

# රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥාපනත (175 වැනි අධිකාරය වන)**

ඌව වෙල්ලස්ස, කොටබෝව, කුඩා කතරගම දේවාලයේ
වාර්ෂික ඇසළ උත්සවය - 2014

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ 2014 වාර්ෂික ඇසළ උත්සවය 2014.07.27 වැනි දින කප් සිටුවීමෙන් ආරම්භ වී 2014.08.11 වැනි දින අලුයම දිය කැපීමේ මංගල්‍යයෙන් නිමාවට පත්වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව 1964 ජූලි 24 වැනි දින අංක 14117 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනතාවගේ අවධානයට ලක් කරමි.

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ,
කොටබෝව කුඩා කතරගම දේවාලයේ
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2014 ජූලි මස 08 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-786/1

---

**ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2014**

1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ කොටබෝව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. *කඳවුරු ප්‍රදේශය :*

කොටබෝවේ "දහමල් ඔය" නමැති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය ඇතුළත ප්‍රදේශය ඇතුළත් වේ.

02. *ගොඩනැගිලි ඉදිකිරීම් :*

මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවකු විසින් හෝ 2014.07.27 වැනි දින සිට 2014.08.11 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳසැලක් ඉදි නොකළ යුතුය.

03. *යාචකයෝ :-*

පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනකදී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදාදීම ද නොකළ යුතුය.

04. *නෑම සහ සේදීම :*

කොටබෝවේ "දහමල් ඔය' නමැති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය ඇතුළත ප්‍රදේශය තුළ කිසිවකු විසින් දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම හෝ වාහන සේදීම නොකළ යුතුය.

05. *වාහන :*

05.01 මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසරයක් රහිතව මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (දහමල් ඔයෙන් නැගෙනහිරට) පැදවීම හෝ ඇතුලු කිරීම නොකළ යුතුය.

05.02 කඳවුරට අයත් කඩබිම් ප්‍රදේශයේ වාහන නතර කිරීමට වෙන් ඇති රිය ගාල්වල හැර අන් කිසිඳු ස්ථානයක වාහනයක් නතර කර නොතැබිය යුතුය.

06. *කාවාඩි කඩ :-*

මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටවනු නොලැබිය යුතුය.

07. *වෙළඳාම :*

07.01 මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයකින් තොරව කඳවුරු භූමිය තුළ තාවකාලික කඩ බඳු දීම හෝ වෙන්දේසි කිරීම නොකළ යුතු ය. තවද මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ප්‍රදේශය තුළ නියම නොකරන ලද ස්ථානයක එවැනි කටයුතු සිදු කිරීම කිසිවෙකු විසින් නොකළ යුතු ය.

07.02 පූජා පෙදෙස, මගී පාලමෙහි හා කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර අයුතු ලෙස ආක්‍රමණය කරන පරිදි යම් මඩුවක් තැනීම හෝ යම් ඉදිකිරීමක් කිරීම හෝ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් විශාල කිරීමක් නොකළ යුතුය. එකී ප්‍රදේශයන්හි සංචාරක වෙළඳාම ද තහනම්ය.

07.03 මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා, භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතු ය.

07.04 යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් ගෙන යාමේ කාර්යය සඳහා සෑම ගොඩනැගිල්ලක, ඉදිකිරීමක හෝ ස්ථානයකම ප්‍රමාණයෙන් ඝණ අඩි 04 1/2 කට අඩු නොවන කුණු බාල්දියක් සපයා තිබිය යුතුය. කුණු බාල්දියට කුණු දමන විට හා ඉන් ඉවත් කරන විට හැර අන් සෑම විටම කුණු බාල්දිය පියනකින් වසා තැබිය යුතුය. තවද සෞඛ්‍ය කම්කරුවන් විසින් කුණු ඉවත ගෙන යෑම සඳහා නියම කරනු ලැබූ වේලාවන්හි දී ඒ භාජන ඒ ස්ථානවල පිටතින් තැබිය යුතු ය.

07.05 විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාරපාන ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතු ය.

08. *සනීපාරක්ෂාව සහ මහජන සෞඛ්‍ය :*

ඒ කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් මළ මුත්‍ර පහ නොකළ යුතු අතර, සලසා ඇති ස්ථානයක හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් ද්‍රව හෝ ඝන කුණු කසල කිසිවක් නොදැමිය යුතු ය.

ම විසින් දමන ලද මෙම ආඥාවන් කිසිම තැනැත්තෙකු විසින් කඩ නොකළ යුතු ය.

ඒ. පතිනාදන්,
මොනරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ,
කොටබෝව කුඩා කතරගම දේවාලයේ
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2014 ජූලි මස 08 වැනි දින,
මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-786/2

---

**වන්දනා ආඥාපනත**

**අතුරලිය යහමුල්ල බෝධිරුක්ඛාරාම ගම්භාර දේවාලයේ ඇසළ පෙරහැර 2014**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යහමුල්ල ශ්‍රී බෝධිරුක්ඛාරාම ගම්භාර දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය 2014 අගෝස්තු මස 04 වැනි දින ආරම්භ වී අගෝස්තු මස 10 වැනි දින දක්වා පැවැත්වෙන බව (175 අධිකාරිය) වන්දනා ආඥා පනත යටතේ සකස් කර 2012 ජූනි මස 07 වැනි දින අංක 1709/14 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසිවල දෙවන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ටී. ජී.සරත් කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2014 ජූලි මස 047 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-696

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/17/2014/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස්කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.07.25 වෙනි දින සිට 2014.08.01 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.08.08 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 2476 වෙළුමේ 205 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ දම්පේ පිහිටි "මලබොඩගහකනත්ත" නමැති ඉඩමේ අංක 1 ඒ දරන කැබැල්ලට පී. ඩී. ජී. වීරසිංහ බලයලත් මානක තැන විසින් 2000.06.05 දින මැන සාදන ලද අංක 5258/1 පිඹුර ප්‍රකාර මායිම්,<br>උතුර : අඩි 10 ක් පළල පාර<br>නැගෙනහිර : ලොට් 1 බී<br>දකුණ : ජස්ටින් පීරිස් සහ ජස්ටින් ප්‍රනාන්දුට අයිති මෙම ඉඩමේ ඩී දරන කට්ටිය.<br>බටහිර : දම්පේ සිට බටකැත්තරට යන පාර<br>ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 20 | 01. එම්. ඒ. වීරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2000.11.25 දින ලියා සහතික කරන ලද අංක 25602 දරන තෑගි ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-652

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/37/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.07.25 වෙනි දින සිට 2014.08.01 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියයවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.08.08 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මැද පත්තුවේ හේවාගම් කෝරළයේ, හොරගල පිහිටි "මිල්ලගහකුඹුර" දැනට ඉඩමේ අංක 2 සහ 3 දරන කැබැල්ලට එච්. එන්. ආර්. කරුණාතිලක | 01. ධර්ම ශ්‍රී ශ්‍රියාසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2010.10.23 දින ලියා සහතික කරන ලද අංක 882 දරන විකුණුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| එන් දරන කොට්ඨාසයේ 371 වෙළුමේ 229 පත් ඉරුව | බලයලත් මානක තැන විසින් 2010.04.07 දින මැන සාදන ලද අංක 1703 පිඹුර ප්‍රකාර මායිම්,<br>උතුර : පී. කොර්නේලිස්, ජී. ඔබියස්සිංඤො, ඩබ්. ඩී. මෙතියස් සිංඤො, ජී. ඇල්බී සිංඤො සහ තවත් අයට අයිති ඉඩම ද මෙම පිඹුරේ අංක 1 දරන කැබැල්ලද අංක 2105 දරන පිඹුරේ 'ඩී4' දරන කැබැල්ල සහ අංක 214 දරන පිඹුරේ අංක 5<br>නැගෙනහිර : අංක 2105 දරන පිඹුරේ 'ඩී4' දරන කැබැල්ල සහ අංක 214 දරන පිඹුරේ අංක 5 සහ ඇල<br>දකුණ : ඇල<br>බටහිර : ඇල<br>ප්‍රමාණය : අ. 0, රූ. 01, පර්. 9.20 | |

ඊ එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක : 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-654

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/11/2014/පිටු/සැ

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.07.25 වෙනි දින සිට 2014.08.01 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමඟ 2014.08.08 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් දරන කොට්ඨාසයේ 238 වෙළුමේ 152 පත් ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, උඩුගහ පත්තුවේ සල්පිටි කෝරළයේ සිද්ධමුල්ල පිහිටි "තානායම්ගොඩැල්ල මූකලාන හෙවත් ඕමත්තේකනත්ත" නැමති ඉඩමේ අංක 03 දරන කැබැල්ලට ඩී. ඩබ්. අබේසිංහ බලයලත් මානක තැන විසින් 1995.06.07 දින මැන සාදන ලද අංක 4945 පිඹුර ප්‍රකාර මායිම්,<br>උතුරු නැගෙනහිර : 963 පිඹුරේ ලොට් 3 බී<br>දකුණු නැගෙනහිර : ලොට් 4 සහ 7 | 01. වී. ඒ. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1995.11.11 දින ලියා සහතික කරන ලද අංක 659 දරන බෙදුම් ඔප්පුව |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | දකුණු බටහිර : වයි. ඒ. ඩී. ඒබ්‍රහම්ගේ තානායම් ගොඩැල්ල මූකලාන හෙවත් ඕමත්තේකනත්ත<br>උතුරු බටහිර : ලොට් 02<br>ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 31 | |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-653

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන 2012

### දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | *2012 දෙසැ. 31 දිනට*<br>*රු.* | *2011 දෙසැ. 31 දිනට ගැලපූ*<br>*රු.* |
|---|---|---|
| (ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත) | | |
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරියත හා උපකරණ | 1,11,85,66,835 | 1,15,91,21,363 |
| කෙරීගෙන යන වැඩ | 12,44,21,560 | 5,89,42,353 |
| ආයෝජන | 26,07,27,751 | 18,76,44,943 |
| **ජංගම වත්කම්** | | |
| ගබඩා තොගය | 4,87,24,952 | 3,64,80,816 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 11,68,53,172 | 12,64,72,516 |
| සේවක ණය අත්තිකාරම් | 8,14,80,747 | 8,37,05,195 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | 9,04,46,161 | 9,28,75,597 |
| තැන්පතු - මහා භාණ්ඩාගාරය | - | - |
| මුදල් හා මුදල් සමානයන් | 2,07,22,250 | 10,60,36,470 |
| **උප එකතුව** | **35,82,77,282** | **44,55,70,594** |
| **වත්කම් එකතුව** | **1,86,19,93,428** | **1,85,12,79,253** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | | |
| මූලධන ආධාර - වැයවූ | 1,00,34,94,810 | 95,37,26,420 |
| මූලධන ආධාර - වැයනොවූ | 7,25,679 | (1,91,83,081) |
| වෙනත් මූලධන ආධාර - විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාව | 58,34,061 | 1,28,68,016 |
| මූලධන ආධාර - වාහන (අය වැය චක්‍රලේඛ - 150) | 1,45,55,000 | 1,63,19,167 |
| විශේෂ ව්‍යාපෘති IRQUE (IDA Credit - 3781 CE) | 13,80,44,944 | 13,80,44,944 |
| උපයාගත් අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය | 1,77,34,966 | 2,09,10,902 |
| ත්‍යාග හා පරිත්‍යාග | 4,13,19,880 | 37,56,016 |
| | **1,22,17,09,341** | **1,12,64,42,384** |

| | 2012 දෙසැ. 31 දිනට<br>රු. | 2011 දෙසැ. 31 දිනට<br>ගැලපූ<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| පොදු සංචිතය | (5,56,30,229) | 4,93,75,484 |
| **ජංගම නොවන වගකීම්** | | |
| විශ්‍රාම පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 29,39,72,676 | 27,88,47,683 |
| **සංචිත සහ අරමුදල්** | | |
| විශේෂ සංචිත | 3,75,05,456 | 1,05,14,109 |
| මූලධන සංචිතය | 2,56,71,311 | 2,56,94,931 |
| අනුස්මරණ අරමුදල් | 1,77,99,656 | 2,54,39,223 |
| විවිධ ව්‍යාපෘති සහ පර්යේෂණ ආධාර | 3,63,16,276 | 2,82,97,491 |
| විලම්භිත ආදායම් - ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 13,62,02,845 | 16,11,02,965 |
| | **25,34,95,545** | **25,10,48,720** |
| **ජංගම වගකීම්** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 2,69,35,572 | 2,93,29,794 |
| උපචිත වියදම් | 8,59,55,483 | 6,59,26,006 |
| ගෙවිය යුතු දෑ | 3,55,55,042 | 5,03,09,181 |
| | **14,84,46,096** | **14,55,64,982** |
| **ස්කන්ධය හා වගකීම්වල එකතුව** | **1,86,19,93,428** | **1,85,12,79,253** |

ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න,
උපකුලපති

කේ. ජී. බ්‍රිටෝ,
ලේඛකාධිකාරී.

ඒ. අයි. එන්. පැස්කුවල්,
මූල්‍යාධිකාරී.

2013 ජූනි මස 10 වැනි දින.

**2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

(ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ ආධාර - පුනරාවර්තන | 1,29,78,68,000 | 1,10,94,47,000 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 73,00,000 | 87,50,000 |
| ශ්‍රී.ල.වි. වි. ක්‍රීඩා තරඟාවලිය සඳහා වි. ප්‍ර. කො. අතිරේක ප්‍රතිපාදන | - | - |
| ආරක්ෂක සේවා සඳහා වි. ප්‍ර. කො. අතිරේක ප්‍රතිපාදන | 40,00,000 | - |
| ශිෂ්‍යාධාර | 2,19,45,000 | 3,32,38,000 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | - | 21,72,500 |
| මහපොළ ශිෂ්‍යත්ව | 13,24,38,150 | 8,56,35,259 |
| අභ්‍යන්තර ආදායම් | 20,10,24,758 | 20,02,64,878 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | 17,84,19,913 | 1,68,38,39,466 |
| හිඟ අර්ථසාධක දායකත්වය - ජීවන වියදම් දීමනාව මත/වි. ප්‍ර. කො. දායකත්වය | 2,25,64,240 | |
| හිඟ විශ්‍රාම වැටුප් දායකත්වය - ජීවන වියදම් දීමනාව මත/වි. ප්‍ර. කො. දායකත්වය | 95,10,145 | - |
| **මුළු ආදායම** | **1,87,50,70,806** | **3,12,33,47,503** |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වැටුප් හා දීමනා | 1,08,95,75,284 | 92,35,50,151 |
| ගමන් වියදම් | 1,17,06,312 | 67,77,591 |

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| සැපයීම් | 6,16,31,364 | 5,58,89,342 |
| නඩත්තු සේවා | 2,45,03,027 | 1,89,06,017 |
| කොන්ත්‍රාත් සේවා | 20,56,21,567 | 18,48,33,115 |
| වෙනත් පුවරාවර්තන වියදම් | 16,24,65,234 | 9,85,47,706 |
| ක්ෂයවීම් | 27,01,89,981 | 14,69,08,407 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | - | 97,06,015 |
| ශිෂ්‍යාධාර | 2,19,45,600 | 3,32,38,400 |
| මහපොළ ශිෂ්‍යත්ව | 132,438,150 | 8,56,29,250 |
| **මුළු වියදම්** | **1,98,00,76,519** | **1,56,39,85,995** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය/අතිරික්තය** | **(10,50,05,713)** | **1,55,93,61,508** |

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2012.12.31<br>දිනට<br>රු. | 2011.12.31<br>දිනට ගැලපු<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් (ඌනතාවය)/අතිරික්තය | (10,50,05,713) | 1,55,93,61,508 |
| **ගැලපීම්** | | |
| ක්ෂය කිරීම | 27,01,89,981 | 14,96,61,229 |
| මොටර් වාහන විකුණුම් මත ලාභය | - | (21,72,500) |
| මෝටර් වාහන විකුණුම් ප්‍රතිෂ්ඨාව | - | 21,72,500 |
| ආයෝජන පොලී | (1,57,49,848) | (56,61,203) |
| විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම | 2,71,14,906 | 3,56,09,932 |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | (16,64,17,576) | (68,92,662) |
| වාහන ප්‍රදාන ක්‍රමක්ෂය | (32,35,833) | - |
| උපයාගත් අරමුදල් තුලින් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ශාස්ත්‍ර පීඨය | (49,05,477) | - |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | (38,61,027) | - |
| පෙර වර්ෂයට අදාළ වෙනත් අරමුදල් | 13,60,771 | - |
| වත්කම් කපා හැරීම | 25,780 | 43,766 |
| පෙර වර්ෂ ගැලපීම් | - | (1,65,24,02,852) |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | (73,00,000) | (87,50,000) |
| කාරක ප්‍රාග්ධනයේ වෙන්ස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (77,84,036) | 7,09,69,717 |
| ගබඩා තොගය (වැඩිවීම/අඩුවීම) | (1,22,44,136) | (99,11,714) |
| ණයගැතියෝ සහ ලැබිය යුතු (වැඩිවීම/අඩුවීම) | 1,72,80,053 | (85,67,174) |
| සේවක ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | 22,24,448 | (1,19,45,339) |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | 24,29,436 | (2,25,51,310) |
| මූලධන වෙන්කිරීම (වැඩවීම/අඩුවීම) | (23,620) | - |
| උපචිත වියදම් (වැඩිවීම/අඩුවීම) | 2,00,29,477 | (14,54,663) |
| ආපසු ගෙවිය යුතු තැන්පත් (වැඩිවීම/අඩුවීම) | (23,94,223) | 13,42,738 |
| තැන්පතු - මහා භාණ්ඩාගාරය (වැඩිවීම/අඩුවීම) | - | - |
| අනෙකුත් ජංගම වගකීම් (වැඩිවීම/අඩුවීම) | (1,47,54,139) | 3,38,67,584 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු ඇති වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 47,63,260 | 5,17,49,839 |
| පාරිතෝෂිත ගෙවීම | (1,19,89,913) | (2,18,85,948) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(72,26,653)** | **2,98,63,891)** |

| | *2012.12.31 දිනට රු.* | *2011.12.31 දිනට ගැලපු රු.* |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (7,98,64,315) | (13,46,18,710) |
| වෙනත් ආධාර මගින් දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (10,69,29,552) | - |
| ආයෝජන පොලී | 80,89,140 | 37,55,759 |
| කෙරීගෙන යන වැඩ | (6,54,79,207) | (5,52,09,802) |
| ආයෝජන | (7,30,82,809) | (8,63,99,735) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(31,72,66,743)** | **(27,24,72,488)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ආධාර | 23,40,00,000 | 18,90,00,000 |
| තැන්පතු - මහා භාණ්ඩාගාරය | - | 2,47,00,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො.) - ව්‍යවහාරික විද්‍යාපීඨය | - | 15,00,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො.) - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | - | - |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො.) - පුස්තකාලය | 10,00,000 | - |
| පිහිනුම් තටාකය සඳහා ආරක්ෂක වැට සහ දාගැබ ඉදිකිරීම | - | 60,00,000 |
| කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් | - | 35,90,000 |
| අනුස්මරණ අරමුදල් | (76,39,568) | 59,81,014 |
| විශේෂිත අරමුදල් | 269,91,346 | 31,53,952 |
| උපයාගත් අරමුදල් දායකත්වය | 17,58,733 | - |
| පර්යේෂණ අරමුදල් | 80,18,785 | 2,04,68,873 |
| ව්‍යාපෘති පාඨමාලා | (2,49,00,120) | (4,27,652) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **23,92,29,177** | **25,39,66,187** |
| මුදල් හා මුදල්වලට සාමනයන් වලින් සිදුවූ ශුද්ධ වෙනස | (8,52,64,220) | 1,13,57,591 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල්වලට සාමානයන් (සටහන 1) | 10,60,36,470 | 9,46,78,878 |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් වලට සාමානයන් (සටහන 1)** | **2,07,72,250** | **10,60,36,470** |

මුදල් හා මුදල්වලට සමානයන්ගේ සංයුතිය

| | | |
|---|---|---|
| **භාණ්ඩාගාර අරමුදල්** | | |
| මහජන බැංකුව ගංගොඩවිල - ගි/අ 097-1-001-6-2315454 (පුනරාවර්තන ආධාර) | 4,468 | 2,45,73,405 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-3-2315455 (මූලධන ආධාර) | 8,336 | 4,67,097 |
| මහජන බැංකුව, ආයතනික ශාඛාව - ගි/අ 004-1-001-0-0210877 | 7,61,824 | 70,45,545 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-9-2315457 (වෛද්‍ය පීඨය) | 18,67,763 | 26,76,849 |
| **උප එකතුව** | **26,42,391** | **3,47,62,896** |
| **භාණ්ඩාගාර නොවන අරමුදල්** | | |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2314567 (පශ්චාත් උපාධි පීඨය) | 41,80,761 | 1,46,30,608 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-165-0034200 (සංවර්ධන අරමුදල) | - | 170 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-6-2315473 (සීඩා සරෙක්) | 13,88,034 | 13,88,034 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-2315474 (සීඩා සරෙක්) | 6,01,789 | 6,01,789 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2315472 (ශිෂ්‍ය සහන අරමුදල) | 1,21,271 | 77,240 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-1-2315456 (බාහිර විභාග ඒකකය) | 23,31,907 | 2,18,09,462 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 0970-1-001-7-0000629 (50 වන සංවත්සර අරමුදල් ගිණුම) | 1,08,220 | 1,08,220 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-0002229 (කළමනාකරණ පීඨ සංවර්ධන අරමුදල) | 53,02,323 | 2,49,67,329 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-5-0005005 (ශාස්ත්‍ර පීඨ අරමුදල) | 9,63,147 | 54,09,633 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-7709343 (සංවර්ධන අරමුදල - වෛද්‍ය පීඨය) | 31,24,416 | 21,53,167 |
| **උප එකතුව** | **1,81,21,869** | **7,11,45,653** |

| | *2012.12.31 දිනට රු.* | *2011.12.31 දිනට ගැලපු රු.* |
|---|---|---|
| **සුළු මුදල් අග්‍රිමය** | | |
| පොදු ගිණුම | 7,990 | 66,457 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ ගිණුම | - | 39,069 |
| වෛද්‍ය පීඨ ගිණුම | - | 3,338 |
| 21 වැනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | - | 6,000 |
| බාහිර විභාග ඒකකය | - | 13,057 |
| **උප එකතුව** | **7,990** | **127,920** |
| මුදල් සංචිතය | - | - |
| **එකතුව** | **20,772,250** | **106,036,470** |

**2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා**

මූල්‍ය වාර්තාවල අදාළ සටහන්

**වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

1. *පොදු :*

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සකස් කර ඇත. වත්කම් අත්පත් කර ගන්නා දිනට පවත්නා වටිනාකම අනුව, වගකීම් දැරූ හා අරමුදල් ලැබූ දිනට පවත්නා වටිනාකම සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වලට අනුකූලව පෙර වර්ෂයන්හි භාවිතා කළ ක්‍රම වලට අනුකූලව ගණුදෙනු සටහන් කර ඇත.

1.1 සංසන්දනාත්මක තොරතුරු

පවත්නා වර්ෂයේ ශේෂයන් වර්ගීකරණය සහ ඉදිරිපත් කිරීම සංසන්දනාත්මක ලෙස තහවුරු කිරීම සඳහා පෙර වර්ෂයට අදාළ ශේෂයන් නැවත වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

2. *වත්කම් හා එහි වටිනාකම් ගණනය කිරීමේ පදනම :*

2.1 දේපළ, පිරියත, උපකරණ හා ක්ෂය

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගයට පෙන්වා ඇත. සියලුම වත්කම් මිලදී ගත් පිරිවැය සහ අනෙකුත් වියදම් වටිනාකමට සටහන් කර ඇත. පරිත්‍යාග වශයෙන් ලැබෙන වත්කම්හි වටිනාකම් එහි පිරිවැය මත ගණනය කර ඇත.

ශ්‍රී. ල. ගි. ප්‍ර. අංක 16ට අනුව පරිත්‍යාග ලෙස ලද දේපළ පිරියත හා උපකරණවල වටිනාකම ප්‍රාග්ධනය කර හා එහි ඵලදායී ආයු කාලය මත ක්‍රමක්ෂය කර ඇත.

වත්කම්වල ඵලදායී ජීවකාලය තුළ පිරිවැය කපා හැරෙන පරිදි පහත සඳන් රේටයන්ට අනුව වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට වත්කම් ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි - සවිකිරීම් ඇතුළුව | 5% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පොත් හා වාර සඟරා | 20% |
| මෝටර් රථ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |

| | |
|---|---|
| උපාධි ලෝගු | 20% |
| ක්‍රීඩා භාණ්ඩ | 20% |
| අනෙකුත් ස්ථාවර වත්කම් (ජල සැපයුම්, විදුලි හා දුරකථන) | 10% |

2.1(ඒ) විශ්ව විද්‍යාලය විසින් ඉපයීම් අරමුදල් හා වෙනත් ව්‍යාපෘති අරමුදල් වලින් මිලදී ගත් දේපළ පිරියත හා උපකරණයන් හි වටිනා කම "උපයාගත් අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය" යටතේ පෙන්වා ඇත.

2.1(බී) ලීසිං පහසුකම් යටතේ ලබා ගත් රු. 8,575,000.00ක් වටිනා මෝටර් රථ, මෝටර් රථ යටතේ පෙන්වා ඇත. මුදල් චක්‍ර ලේඛ අංක 8/2011 (අයවැය චක්‍රලේඛ අංක 150 - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය) අනුව ලීසිං වාරික මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබේ.

2.1(සී) විශ්වවිද්‍යාල තාරුණ්‍යයට හෙටක් ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 40ක් පමණ වටිනා පිහිනුම් තටාකය 2010 වසරේදී ආධාර ලෙස ලැබී ඇත. රාජ්‍ය තක්සේරු ආයතනයෙන් පිහිනුම් තටාකයේ නිවැරදි වටිනාකම, ප්‍රාග්ධනිත කිරීම සඳහා ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.

(ඩී) වර්ෂය තුළ රුපියල් 244,581.00ක් වටිනා කාර්යාල උපකරණ ද රුපියල් 3,609,853.43ක් වටිනා පුස්තකාල පොත් ද, විශ්ව විද්‍යාලයට 21 වන ශත වර්ෂ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මගින් ලැබිණ නමුත් මෙම වත්කම් හි අයිතිය විශ්ව විද්‍යාලය වෙත ලැබී නොමැති බැවින්, අදාළ වටිනාකම වත්කම් හි ඇතුළත්ව නොමැත.

2.2 *තොගය*

ගබඩා තොග වටිනාකම ගණනය කිරීම සඳහා පළමුවෙන් ලැබීම්, පළමුවෙන් නිකුත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ. ගබඩා තොග භෞතික වශයෙන් ගණනය කර ශේෂ පත්‍ර දිනට වටිනාකම ගණනය කරනු ලැබේ.

2.3 *සේවකයන්ට ගෙවනු ලබන ණය සහ අත්තිකාරම්*

සේවකයන්ගෙන් අයකර ගැනීමට නියමිත ණය මුදල ලැබිය යුතු මුදල ලෙස ගණනය කර ඇත.

3. පාරිතෝෂිත සඳහා වෙන් කිරීම :

පාරිතෝෂිත සඳහා වෙන් කිරීම, පාරිතෝෂිත පනතට අනුව ගණනය කර ඇත. මෙම වෙන් කිරීම සඳහා බාහිර වශයෙන් අරමුදල් පිහිටුවා නැත.

4. උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම :

ඇස්තමේන්තු හා ලැබී ඇති ලිපිලේඛනවල තොරතුරු මත උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

5. ලැබිය යුතු දෑ :

ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ කාර්ය මණ්ඩලයෙන් 2012.12.31 දිනට රුපියල් 72,953,034.43ක මුදලක් අයකර ගැනීමට ඇත.

6. ආධාර සඳහා ගිණුම්කරණය :

පුනරාවර්තන ආධාර, මුදල් පදනම මත ආදායම් වියදම් වාර්තාවේ හඳුනා ගෙන ඇත. ස්ථාවර වත්කම් පුනරුත්ථාපන පිරිවැය සහ ප්‍රාග්ධන ආධාර සඳහා ඉදිකිරීම් සහ නව ව්‍යාපෘති, කෙරීගෙන යන වැඩ හෝ ස්ථාවර වත්කම් ලෙස අවශ්‍ය පරිදි හඳුනාගෙන ඇත.

7. ආදායම හඳුනාගැනීම :

7.1. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර, ශිෂ්‍යාධාර හා මහපොළ මුදල් පදනම මත හඳුනාගැනේ.

7.2 මූල්‍ය පාඨමාලාවන්හි ඉපයීම් අදාළ පාඨමාලා පවත්නා කාළය, වියදමට ගැලපෙන ලෙස හඳුනාගෙන ඇත.

8. පෙර වර්ෂ ගැලපීම් :

2000 වර්ෂයේ දී පුස්තකාල ගොඩනැගිල්ලේ වහළයේ කොටසක් විනාශ විය. 2006 වර්ෂයේ දී එය යථාතත්වයට පත් කිරීම සඳහා රුපියල් 9,176,071.00ක මුදල් වැය විය. 2006 වර්ෂයේ අවසන් ගිණුම් හි මෙම වියදම පුස්තකාල ගොඩනැගිල්ලේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරන ලදී. ශ්‍රී. ල. ගි. ප්‍ර. අංක 14ට අනුව මෙම වියදම ප්‍රාග්ධනිත කිරීම සිදු කළ නොහැක. මන්ද මෙහි ආරම්භයේ තක්සේරු කළ ක්‍රියාකාරිත්වයේ වැඩිවීමක් සිදු නොවන නිසාය. මෙම වරද ගොඩනැගිලි ගිණුමෙන් රුපියල් 9,176,0171.00ක් අඩුකර, එය පෙර වර්ෂ ගැලපීමක් බැවින් එම මුදල පොදු සංචිත අරමුදලට ගලපන ලදී.

9. ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදාන ගිණුම්කරණය :

ශ්‍රී. ල. ගි. ප්‍ර. අංක 20ට අනුව ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදාන අවසාන ගිණුම්වල දක්වා ඇත. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව රජයේ ප්‍රදාන විලම්භිත ආදායම ලෙස අවසාන ගිණුම්වල හඳුනාගෙන ඇති අතර, වත්කමේ ජීවන කාලය අනුව ක්‍රම ක්ෂය කර ඇත. පෙර වර්ෂ සඳහා වූ රජයේ ප්‍රදාන ඒ අනුව ගලපා ඇති අතර පෙර වර්ෂ සඳහා අදාළ වන බැවින් රුපියල් 1,313,826,100.00ක මුදල පොදු සංචිතය මගින් ගැලපීම් සිදුකර ඇත.

2.1 තත්ත්වාගණනය කළ මතය :

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

07-825

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 මැයි මස 02 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරු ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කළ අංක 6247 හා 2011 අප්‍රේල් මස 01 ද, ප්‍රසිද්ධ නොතාරිස් fපිලිෂියන් පෙරේරා ලියා සහතික කළ අංක 3074 හා 2011 ජූනි 20 දින ද ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කළ අංක 6680 හා 2011 නොවැම්බර් 16 දින ද, ප්‍රසිද්ධ නොතාරිස් fපිලිෂියන් පෙරේරා ලියා සහතික කළ අංක 3622 හා 2012 නොවැම්බර් මස 22 දින දරන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, වාරියපොළ, වහන්තරේ, පිහිටි එච්. එම්. ඩී. කේ. හාල්මෝල යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන බාලසූරිය මුදියන්සේලාගේ කුමාරතිලක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 පෙබරවාරි මස 28 වැනි දිනට ඉහත කී අංක 6247, 3074, 6680 හා 3622 යන උකස් බැඳුම්කර මත එකී බාලසූරිය මුදියන්සේලාගේ කුමාරතිලක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හතලිස් හයලක්ෂ හැටතුන් දහස් අටසිය අනූනවයකුත් ශත අසූනවයක (රු. 46,63,899.89) මුදලක් සහ 2014 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිපන් ලක්ෂ පහලොස් දහස් හාරසිය හැත්තෑඅටකුත් ශත අසූපහක් (රු. 25,15,478.85) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද, රුපියල් හාරලක්ෂ හතලිස් තුන් දහස් තුන්සිය විසිහයක් (රු. 4,43,326) සඳහා, මෙහි පහත දැක්වෙන පාදක පොලි අනුපාතික අතරින් එනම්,

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද, රුපියල් දහතුන් ලක්ෂ පනස් හත් දහස් එකසිය හතළිහක් (රු. 13,57,140) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයට වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හතලිස් හයලක්ෂ හැටතුන් දහස් අටසිය අනූනවයකුත් ශත අනූනවයක (රු. 46,63,899.89) මුදලක් සහ 2014 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිපත් ලක්ෂ පහලොස් දහස් හාරසිය හැත්තෑඅටකුත් ශත අසූපහක් (රු. 25,15,478.85) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලි අනුපාතික අතරින් එනම්,

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළි අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට හතක (7%) ආන්තියක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද රුපියල් හාරලක්ෂ හතලිස් තුන් දහස් තුන්සිය විසිහයක් (රු. 4,43,326) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළි අනුපාතික අතරින් එනම්,

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළි අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයකට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තියක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද රුපියල් දහතුන් ලක්ෂ පනස් හත්දහස් එකසිය හතළිහක් (රු. 13,57,140) සඳහා එක් එක් මාසයේ ව්‍යාපර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයට වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය හා එහි පිහිටි වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 6247, 3074, 6680 හා 3622 දරන උකස් බැඳුම්කර මගින් එකී බාලසූරිය මුදියන්සේලාගේ කුමාරතිලක යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා එහි පිහිටි ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 6247, 3074, 6680 හා 3622 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, දේවමැද්දෙ කෝරළේ, වහන්තරේ ග්‍රාමයේ පිහිටි නාරංගහමුලවත්ත නොහොත් කහටගහමුලවත්ත නමැති ඉඩමේ බලයලත් මානක කේ. සිවඥානසුන්දරම් මැන සකස් කළ අංක 2378 හා 1977. 07.25 දින දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ගම්සභා පාර සහ එකී පිඹුරේ ලොට් අංක 7 ද, දකුණට : එකී පිඹුරේ ලොට් අංක 7 සහ 3 ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් තිස්හතක් (අ. 0. රූ. 1, පර්. 37) බිම් ප්‍රමාණයෙන් යුත් සහ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබෙන ඉඩම් සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙයට එකී පිඹුරේ නිරූපිත ලොට් අංක 7 ලකුණු කළ පාර පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය ද ඇතුළත් වේ.

මෑතකදී කරන ලද මැනුමකට අනුව, ඉහත සඳහන් ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

ඉහත කී නාරංගහමුලවත්ත නමැති ඉඩමේ බලයලත් මානක ආරියදාස අතපත්තු මැන සකස් කළ අංක 33/2009 හා 2009.03.08 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ, උතුරට : නාවින්න පාරේ සිට වහන්තරේ වැවට යන ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : අංක 2378 දරන පිඹුරේ ලොට් අංක 7 ලකුණු කළ පාර ද, දකුණට : අංක 2378 දරන පිඹුරේ ලොට් අංක 7 සහ 3 ද, බස්නාහිරට : අංක 2378 දරන පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් තිස්හතක් (අ. 0, රූ. 1, පර්. 37) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

තව ද මෙහි විස්තර කර තිබෙන මාර්ගයෙන්, එයි මතින් සහ/හෝ ඔස්සේ උකස්කරුට ද ඔහුගේ ආගන්තුකයන්ට ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහ නිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට අවසරලාභීන්ට හා ආරාධිතයන්ට මින් ඉදිරියට සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රිකාලයේ පාගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින්, අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් සමඟ හෝ නොමැතිව ද, මෝටර් කාර්, මෝටර් ලොරි සහ සෑම ආකාරයකම වෙනත් වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි පහත විශේෂයෙන් විස්තර කරන බිම තුළින් මතින් සහ/හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට හා ප්‍රත්‍යාගමනය කිරීමට ද ඇතුළුවීමට හා පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම නිදහස හා අවසරය ද එම බිමෙන්, එය ඔස්සේ සහ ඊට උඩින් විදුලි රැහැන්, මුදුන් කම්බි ඇදීමේ සහ ගෑස්, ජලාපවහන හා ජලනල එළීමේ හා වෙනත් කවර වූ හෝ ආකාර උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතිය ද ඇතුළත් වේ.

ඊට අනුබද්ධිතව දරනු ලබන, භාවිතා කරනු ලබන හා භුක්ති විඳුනු ලබන හෝ ඊට අඩංගු සියලු හා එක් එක් අයිතිවාසිකම් හිමිකම්, වරප්‍රසාද සහ මෙහි පහත නිශ්චිතව සඳහන් යන්ත්‍රෝපකරණ, එනම්,

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ඩ්‍රයර් | 01 |
| බොයිලේරු | 01 |
| මිලිං මැෂින් | 01 |
| එලිවේටර් | 02 |

සහ වාරියපොළ, වහන්තරේ එච්. එම්. ඩී. කේ. හාල්මෝල පරිශ්‍රයේ ස්ථානගත කර තිබෙන වෙනත් යන්ත්‍ර සූත්‍ර මෙයට අයත් ය.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

07-817

---

**ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 මැයි මස 30 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ලෙස කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ජයම්පත් අනුර රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 902 සහ 2010 සැප්තැම්බර් මස 28 දින ද, අංක 968 හා 2011 පෙබරවාරි මස 28 දින ද, අංක 814 හා 2009 දෙසැම්බර් 30 දින දරන උකස් බැඳුම්කර මත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සේපාලි වලතර ලියා සහතික කළ අංක 1535 හා 2007 සැප්තැම්බර් 27 දින ද, රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් නිරෝෂන් රණසිංහ බණ්ඩාර ලියා සහතික කළ අංක 1534 හා 2012 සැප්තැම්බර් 28 දින ද දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "රුද්‍රා ජේන්ට්ස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස දෙහිවල, නැදිමාල, විෂ්ණු කෝවිල පාර, අංක 56/2 දරන ස්ථානයේ ව්‍යාපාරය කරගෙන යන හෙට්ටිආරච්චිගේ නිමල් උපුල් නන්දන, දිගෝ ආරච්චිල්ලාගේ ජයතිලක දිගෝආරච්චි, හකමුවේ මුදන්නායක ප්‍රියල් මලින්ද මුදන්නායක සහ මීරා ලෙබ්බේ මකීන් අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 මාර්තු මස 17 වැනි දිනට ඉහත කී අංක 902, 1534, 968, 1535 සහ 814 යන උකස් බැඳුම්කර මත එකී හෙට්ටිආරච්චිගේ නිමල් උපුල් නන්දන, දිගෝ ආරච්චිල්ලාගේ ජයතිලක දිගෝආරච්චි, හකමුවේ මුදන්නායක ප්‍රියල් මලින්ද මුදන්නායක සහ මීරා ලෙබ්බේ මකීන් යන අයගෙන් අයිරා ශේෂය වූ රුපියල් එක්කෝටි දහහත් ලක්ෂ හතලිස්හත් දහස් අටසිය පනස් අටක (රු. 1,17,47,858) මුදලක් සහ ඒ සඳහා 2014 මාර්තු මස 18 වැනි දින පටන් වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ආගණනය කළ පොළිය ද සමග ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට ලැබිය යුතුව හා අයවිය යුතුව තිබෙන හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි දහහත් ලක්ෂ හතලිස්හත් දහස් අටසිය පනස් අටක (රු. 1,17,47, 858) මුදල සහ ඒ සඳහා 2014 මාර්තු මස 18 වැනි දින පටන් වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ආගණනය කළ පොළිය ද හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සඳහා එහි පිහිටි වෙනත් සියලු දේ හා වෙළඳ බඩු තොග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 902, 1534, 968, 1535 හා 814 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැයකර කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත අංක 902 හා 1534 දරන උකස් බැඳුම්කර මගින් හෙට්ටිආරච්චිගේ නිමල් උපුල් නන්දන විසින් උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද, අංක 968 හා 814 දරන උකස් බැඳුම්කර මගින් දිගෝ ආරච්චිල්ලාගේ ජයතිලක දිගෝ ආරච්චි විසින් උකස් කර තිබෙන, මෙහි පහත විස්තර කරන ඉඩම, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද, සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුව වෙත අංක 1535 දරන උකස් බැඳුම්කරය මගින් හෙට්ටිආරච්චිගේ නිමල් උපල් නන්දන සහ මීරා ලෙබ්බේ මකීන් යන අය විසින් උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන බඩු තොග ද කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 902 සහ 1534 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, පල්ලේ පත්තුවේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම්/ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත බුලුගහපිටිය ග්‍රාම සේවා වසමේ, බලුගහපිටිය ග්‍රාමයේ පිහිටි "මහඅරඹ, දෙල්ගහවත්ත සහ පොල්ගස්තුන වත්ත" නමැති ඉඩමේ බලයලත් මානක ඒ. වෙලගෙදර මැන සකස් කළ අංක 241A හා 1987.10.30 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 7 ලකුණු කල බිම් කට්ටිය වූ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : දැනට පාලුවත්ත නොහොත් අලුත්වත්ත ලෙස හැඳින්වෙන පිටදෙනිය සහ පරණවත්ත ද, දකුණට : දැනට පාලුවත්ත නොහොත් අලුත්වත්ත ලෙස හැඳින්වෙන පරණවත්ත ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 241A දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිහතරකුත් දශම අටයි හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 24.875) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, තිරවුර සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

*අංක 968 සහ 814 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, පල්ලේ පත්තුවේ, බුලුගහපිටිය ග්‍රාමයේ පිහිටි "තිප්පල ළඟ නුගේහේන සහ තිප්ලලේවත්ත නැගෙනහිර කොටස නොහොත් හික්ගහවත්ත කොටසක්" නමැති ඉඩමේ බලයලත් මානක ඒ. වෙලගෙදර මැන සකස් කළ අංක 4070 හා 2007.03.15 දින දරන පිඹුරේ නිරූපිත බිම් කට්ටියට මායිම්, උතුරට : කොස්වත්ත ද, නැගෙනහිරට : දිගෝ ආරච්චිලගේ හේන ද, දකුණට : ප්‍රසිද්ධ පාර තිප්පලේවත්ත සහ හික්ගහවත්ත කොටසක් ද, බස්නාහිරට : තිප්පලළඟ නුගේහේන ද යන මායිම් ඇතුළත පිහිටි අක්කර දෙකකුත් පර්චස් එකොළහයි දශම අටයි එකක් (අ. 2, රූ. 0, පර්. 11.81) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

අංක 1535 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

පහත සඳහන් ද්‍රව්‍ය ඇතුළුව එනම්,

AP KOTT වෝල් පොටි
AP වෝල් ෆිලර්
AP ක්ලැසික්
වෙදර් ටෆ්
රෝයල් එමල්ෂන්
පර්මි එමල්ෂන් රෝයල් බේස්
පර්මග්ලෝස් එමල්ෂන්
වෙදර් ටෆ් ඇල්ටිමා
බේස් AW
බේස් BW
ඩෙකෝරා DW
ඩෙකෝරා
පර්මග්ලෝස් එමල්ෂන්
පර්මග්ලෝස් ඕල් වෙදර්
වෙදර් ටෆ්
එනමොල් බේස්
පර්මග්ලෝස් එනැමල්
ඉපොක්සිෆ්ලෝ ජේන්ට්
සැන්ඩිං සීලර්
PU වාර්නිෂ්
ඇන්ටි ග්‍රෝසු
ඇලුමිනියම් වුඩ් ප්‍රයිමර්
ඇලුමිනියම් බ්‍රයිට් ජේන්ට්
QD ෆ්ලෝ ජේන්ට්
ඇකෝ රූෆිං ජේන්ට්
රෝඩ් මාකිං
වුඩ් ප්‍රිසර්වේටිව්
වුඩ් ස්ටේන්
ඩෙකෝරා එනැමල්
හැරිස්ට්‍රේ රෝලර් ඇන්ඩ් බ්‍රෂ්
සෑන්ඩ් ජේපර්
ඉලෙකෝ මැෂිනෝ කලරන්ට්

සහ ශ්‍රී ලංකා ජනරජයේ, සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බටුගෙදර මහවීදියේ අංක 199/1/1 දරන පරිශ්‍රය තුළ සහ මත ගබඩාකර තිබෙන වෙනත් සියලු අයිතම සෑම ආකාරයකම හා සෑම විස්තරයකටම අයත් කවර වූ හෝ වෙනත් චංචල දේපළ ද උකස්කරුවන් විසින් කලින් කල ව්‍යාපාරය කරගෙන යන හෝ මින් මතු යම් කලක හා කලින් කල උකස්කරුවන් විසින් ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් සියලු ගුදම් ගබඩා සහ පරිශ්‍ර තුළ හෝ මත තිබෙන සෑම ආකාරයකම සහ සෑම ස්වභාවයකම වෙනත් සියලු අයිතම හා වෙනත් චංචල දේපළ හෝ එම ව්‍යාපර බඩු තොග, වෙළඳ භාණ්ඩ, බඩු බාහිරාදිය සහ දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි හා නොනිමි භාණ්ඩ, හා කවර හෝ වර්ගයකට හෝ ස්වභාවයක චංචල දේපළ ද, මින් ඉදිරියට යම් කාලයක සහ කලින් කල හා සෑම කල්හිම එම ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය සහ අමුද්‍රව්‍ය, නිමි හා නොනිමි භාණ්ඩ යනාදිය ගබඩා කර, තබා හෝ දමා තිබිය හැකි යම් ගුදම්, ගබඩා හා පරිශ්‍රවල ඇති උකස්කරුවන්ගේ සියලු අයිතම හා චංචල දේපළ ද, මෙම බැඳුම්කරය බලාත්මකව පවතින කාලය ඇතුළත යම් වේලාවක සහ කලින් කල හා සෑම කල්හිම උකස්කරුවන් විසින් එකී ගුදම්, ගබඩා හා පරිශ්‍ර තුළට හෝ මතට ගෙනැවිත් තබනු, ගබඩා කරනු හෝ දමනු ලැබිය හැකි සියලු ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය, බඩු බාහිරාදිය හා දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි හා නොනිමි භාණ්ඩ, සහ වෙනත් සියලු අයිතම හා චංචල දේපළ ද උකස්කරුවන් විසින් එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය මින් මතු කලින් කල ඉවත් කරගෙන යනු ලබන හෝ එකී ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය සහ දේවල් හා අමුද්‍රව්‍ය නිමි හා නොනිමි භාණ්ඩ සහ වෙනත් සියලු අයිතම හා කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක වූ හා ඉහත කී ගුදම්, ගබඩා සහ පරිශ්‍ර හෝ ව්‍යාපාර ස්ථානවලින් හෝ ව්‍යාපාර ස්ථාන තුලට ගෙනයමින් පවතින සියලු සංක්‍රාන්තික දේපළ හා නැව්ගත කිරීම හෝ නිශ්කාෂනය අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ වාප්පුවේ හෝ ගුදම්වල තිබෙන උකස්කරුවන්ගේ වෙනත් සියලු චංචල දේපළ ඇතුලුව වෙනත් සියලු අයිතම හා කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක චංචල දේපළ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

07-818

---

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2610000007.

ණයකරුගේ සම්පූර්ණ නම : හේමන්ත පරණතන්ත්‍රි සහ ප්‍රියන්ති රෝහිණී පරණතන්ත්‍රි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ආර්. එල්. කේ. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 1363 හා 2010.08.31 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 සහ 2001 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් පන් ලක්ෂ තිස්හය දහස් පන්සිය අසූතුනයි ශත අනූ දෙක (රු. 4,536,583.92) මුදලක් වර්ෂ 2014.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්පන් ලක්ෂ හැටහත් දහස් පන්සිය පනස් හයයි ශත දහය (රු. 3,567,556.10) මුදල ද වර්ෂ 2014.01.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් නව ලක්ෂ හැට නව දහස් විසිහතයි ශත අසූ දෙක (රු. 9,69,027.82) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතලිස් පන් ලක්ෂ තිස්හය දහස් පන්සිය අසූතුනයි ශත අනූ දෙක (රු. 4,536,583.92) ද,

(2) එකී රුපියල් තිස්පන් ලක්ෂ හැටහත් දහස් පන්සිය පනස් හයයි ශත දහය (රු. 3,567,556.10) මුදල මත අයවිය යුතු වර්ෂයකට 19.5% බැගින් වන පොලියක් 2014.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 26 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, අංක 494- උතුරු හෝකන්දර දරන ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කඩුවෙල මහ නගර සභා සීමාවේ, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසයේ, උතුරු හෝකන්දර හි පිහිටි පොල්කොටුවේවත්ත නමැති ඉඩමට 2008.11.05 වැනි දින කේ. වී. එම්. ඩබ්ලිව්. සමරනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 3588 පිඹුර ප්‍රකාර කැබලි අංක 20 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 19 සහ කැබලි අංක 13 (මීටර් 6 සිට මීටර් 9 දක්වා පළල පාර සඳහා වෙන් කළ කොටස) ද, නැගෙනහිරට : කැබලි අංක 13 (මීටර් 6 සිට මීටර් 9 දක්වා පළල පාර සඳහා වෙන්කළ කොටස) සහ කැබලි අංක 21 ද, දකුණට : කැබලි අංක 21 සහ කුඹුර ද සහ බටහිරට : කුඹුර සහ කැබලි අංක 19 ද යන මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම එකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 7.10) ක වපසරියකින් යුතු ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1884/80හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී උතුරු හෝකන්දර හි පිහිටි පොල්කොටුවේවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 3588 පිඹුර ප්‍රකාර කැබලි අංක 21 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 20 සහ කැබලි අංක 13 (මීටර් 6 සිට මීටර් 9 දක්වා පළල පාර සඳහා වෙන්කළ කෙටස) ද, නැගෙනහිරට : කැබලි අංක 13 (මීටර් 6 සිට මීටර් 9 දක්වා පළල පාර සඳහා වෙන් කොටස) සහ කැබලි අංක 22 ද, දකුණට : කැබලි අංක 22 සහ කුඹුර ද සහ බටහිරට : කුඹුර සහ කැබලි අංක 20 ද යන මායිම් තුළ පිහිටි පර්චස් හත (අ. 0, රූ. 0, පර්. 7) ක වපසරියකින් යුතු ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියළු දේ ද සමග හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1884/81හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම මතින් මාර්ග පරවශ්‍යතා අයිතිය සමග වේ.

ඉහත කී උතුරු හෝකන්දර හි පිහිටි පොල්කොටුවේවත්ත නැමති ඉඩමට ඉහත කී අංක 3588 පිඹුර ප්‍රකාර කැබලි අංක 13 දරන මීටර් 6 සිට මීටර් 9 දක්වා පළල පාරට මායිම් උතුරට : කැබලි අංක 2 සිට කැබලි අංක 12 දක්වා ද කැබලි අංක 14. 15, 33, 34 සහ 35 ද, නැගෙනහිරට : අමරගොඩ පාර ද, කැබලි අංක 30, 29. 28, 27,26, 25, 24, 33, 34 සහ 31 ද, දකුණට : පිඹුරු අංක 1937 හි කැබලි අංක 2 ද, කැබලි අංක 30, 31, 34 සහ කැබලි අංක 18 සිට කැබලි අංක 23 දක්වා ද, බස්නාහිරට : කැබලි අංක 11 සහ 15 සිට 23 දක්වා ද, කැබලි අංක 31, 32 සහ 33 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිහතයි දශම හතර (අ. 0, රූ. 1, පර්. 27.4) හෝ හෙක්ටයාර් 0.01750 වූ පාරට වෙන්කළ බිම් කොටස වේ. එකී ඉඩමේ කොටස හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1864/209 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

නිමල් ජේ. බී. මාමදුව,
සාමාන්‍යාධිකාරී.

2014 ජූලි මස 02 වැනි දින,
ශ්‍රී. ල. නි. ස. මූ. සං. බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
තැ. පෙ. 2085, කොළඹ 02.

08-830

---

### යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

#### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යූනියන් බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 මැයි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගම්පොල, නාරන්විට, ඉහළවෙල, පේරගොල්ල වතුයාගේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 810074183V හිමි මොහොමඩ් ඉර්ෂාඩ් මොහොමඩ් මුහීර් නොහොත් මොහොමඩ් ඉර්සාඩ් මොහොමඩ් මුහීර් යන අය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) යූනියන් බැංකුවෙන් රුපියල් 1,500,000ක ස්ථිර අයිරා පහසුකමක් සහ පිළිවෙලින් රුපියල් 12,750,000 ක සහ රුපියල් 500,000 ක වාර ණය ආකාරයෙන් ණය පහසුකම් දෙකක් ඇතුළුව කලින් කලට බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී උකස්කරු ඉහත කී ස්ථිර අයිරා පහසුකම් සහ වාර ණය පහසුකම් දෙක නිසා රුපියල් එක්කෝටි හතලිස් දෙලක්ෂ පන්දහසක (රු. 1,42,50,000) මුදල සඳහා, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. යූ. කැප්පෙටිපොල විසින් සහතික කරන ලද අංක 26912 සහ 2013.08.02 දින දරන මූලික උකස් බැඳුම්කරය ලියා අත්සන් කිරීමෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ යූනියන් බැංකුව වෙත ඉහත කී මුදල සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඒ අනුව, ඉහත කී අයිරා පහසුකම් සහ වාර ණය පහසුකම් නිසා එම බැංකුවේ පහසුම් මත 2014.01.31 වැනි දිනට රුපියල් එක්කෝටි හතලිස් හතරලක්ෂ දසදහස් හාරසිය අනූවකුත් ශත හතලිස්හතක (රු. 1,44,10,490.47) මුදලක් සහ ඒ මත 2014.02.01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් පොලිය ද එකී උකස්කරුගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය එකී උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසු, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත සඳහන් අයිරා පහසුකම් සහ වාර ණය පහසුකම් මත 2014.01.31 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් එක්කෝටි හතලිස් හතරලක්ෂ දසදහස් හාරසිය අනූවකුත් ශත හතලිස් හතක (රුපියල් 14,410,490.47) මුදල සහ ඒ මත 2014.02.01 වැනි දින සිට පොළිය ද, තවද ඉහත කී අංක 26912 සහ 2013.08.02 දින දරන බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 26912 සහ 2013.08.02 දින දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී අංක 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩි සේනානායක වෙත බලය පැවරීමට 1990 අංක 04 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ උඩ පළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ උඩ පළාත කඩුකාර පහල කෝරළේ අටුවවත්ත ග්‍රාම සේවා වසමේ නාරම්විට පිහිටි "පේරගොල්ලහේන" නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු බී. එම්. ගුණවර්ධන විසින් 2009.05.27 වැනි දින නැවත බෙදන ලද, අංක 4419 දරන මානක පිඹුර ප්‍රකාර කැබලි අංක 2 දරන බිම් කොටසේ අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් මැන සාදන ලද අංක 4419 සහ 2000.12.31 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 2A දරන බිම් කොටසට මායිම් උතුරට : වර්තමානයේ උඩ පළාත ප්‍රාදේශීය සභාවට අයිති පාර ද, නැගෙනහිරට : ඉහත කී අංක 4419 දරන මානක පිඹුර ප්‍රකාර කැබලි අංක 2 දරන බිම් කොටසේ අනු බෙදීමක් වන කැබලි අංක 2B ද, දකුණට : පේරගොල්ලවත්තේ පැළ ඉනි වැට ද, බස්නාහිරට : ඉහත කී මානක පිඹුරේ කැබලි අංක 1 දරන බිම් කොටස සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මායිම් කොන්ක්‍රීට් ස්ථම්භය ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු, ආදී සෑම සියලුදේත් සමග ය. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C285/197 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-824